විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation

මගේ අංකය / எனது இல. / My No. } Pen/Pol/06/05-2025

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

දිනය / திகதி / Date } 2025.07.23

**විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි : 02/2025**

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II හි 2018.01.01, 2019.01.01 සහ 2020.01.01 දිනට හිමිවිය යුතු වැටුප මත විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2025.07.01 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/2025 හා බැඳේ.

02. 2025.07.01 දින සිට ක්‍රියාත්මක කළ යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අමතර වශයෙන් පහත උපදෙස් නිකුත් කරන බව කාරුණිකව දන්වමි.

i. මේ දක්වා සිදු කර ඇති විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයන්හි දී සේවයේ යෙදී සිටිය දී මිය ගිය නිලධරයන්ගේ සේවා කාලය ගණනය කිරීම සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 07/2000 හි විධිවිධාන විවිධාකාරයෙන් අදාළ කර ගැනීම මත ගැටළු සහගත තත්ත්වයක් පැන නැගී ඇති බව නිරීක්ෂණය වී ඇත. 2025 වර්ෂයේ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන කටයුතු අවසන් වූ වහාම මෙම ගැටළු සහගත තත්ත්වය සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙතින් ද උපදෙස් ලබා ගෙන අවසන් තීරණයක් ලබා දීමට කටයුතු කරන අතර එතෙක් 2025.07.01 දින සිට විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදු ක්‍ර ගෙන යාම සඳහා එම නිලධරයන්ගේ සේවා කාලය ගණනය කිරීමේ දී, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමට පදනම් කර ගෙන ඇති සේවා කාලයම අදාළ කර ගැනීම සුදුසු බව තීරණය කර ඇත. එකී තීරණය අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

ii. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 12 වගන්ති සහ 2 හා 15 වගන්ති යටතේ විශ්‍රාම ගන්වා ඇති විශ්‍රාමිකයින්ට අදාළ විශ්‍රාම වැටුප් ලිපි ගොනු අතරින් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධන දත්ත පද්ධතිය මගින් නිරූපනය කරනු ලබන තොරතුරු විශ්‍රාම වැටුප් ලිපිගොනු අනුව පරීක්ෂා කිරීමේ දී නිවැරදි බව සනාථ වන ලිපිගොනු සඳහා පමණක් දත්ත පද්ධතිය මගින් විශ්‍රාම වැටුප

ප්‍රතිශෝධනය සිදු කිරීමට හැකියාව පවතී. ඉහත පරිදි තොරතුරු සනාථ කර ගැනීමට නොහැකි ලිපිගොනු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය සිදු කළ යුතු ආකාරය පිළිබඳව ඉදිරියේ දී උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලැබේ.

**චාමින්ද හෙට්ටිආරච්චි**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකථනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com

**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.
9) පාර්ලිමේන්තු මහ ලේකම් - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.